ර/කරවිට මධ්‍ය විද්‍යාලය

සැකසුම - එල්. මහේෂ් විජේවර්ධන

නිපුණතාවය - නිෂ්පාදන සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් නිර්මාණය කරයි.

නිපුණතා මට්ටම - ළමා කතන්දර පොතකට සුදුසු පිටකවරයක් නිර්මාණය කරයි.

ක්‍රියාකාරකම් - ළමා පොත් පිට කවරයක් නිර්මාණය කරමු.

පැවරුම - පහත පියවර අනුව නිර්මාණය කරණයේ යෙදෙන්න.

පියවර 1 - ඔබ නිවසේ ඇති ළමා කතන්දර පොත් කිහිපයක් සපයාගන්න.

පියවර 2 - ඒවායේ පිටකවර නිර්මාණය කර ඇති ආකාරය, වර්ණය, හැඩතල, රේඛා, තේමාව හා උචිත බව ආදිය හොඳින් අධ්‍යයනය කරන්න.

පියවර3 - ඔබ අධ්‍යයනය කර නිර්මාණාත්මක ලක්ෂණ අනුව ඔබ දන්නා ළමා කතන්දරයකට සුදුසු වන පරිදි කතන්දර පොත් පිට කවරයක් සැලසුම් කරන්න එහිදී කතන්දරේ ඇතුළත් ප්‍රධාන චරිත ඇසුරෙන් එහි සිද්ධියක් පදනම් කරගෙන වුවද පිට කවරය සැලසුම් කළ හැක.

පියවර 4 - එම පිට කවරය සඳහා කෙටි නිර්මාණාත්මක කතන්දරයේ නමක් යොදා නිර්මාණාත්මක අක්ෂර භාවිත කොට ඔබගේ අඳින කඩදාසිය තුළ සැලසුම් කළ නිර්මාණය සිදු කරන්න.

පියවර 5 - පිටකවරයට අදාළ වර්ණ (දීප්තිමත් ළමා මනසට ගැළපෙන වර්ණ) යොදා ගනිමින් ළමා පොත් පිට කවරය වර්ණ කරන්න.